12-06-2022 මධුබන් අව්‍යක්ත් බාප්දාදා ඕම් ශාන්ති 1991/04/03

## සියලු සීමාවන්ගෙන් ඉවත් වී අසීමිත නිරාශාව ඇති කෙනෙක් වන්න.

අද දින කල්පයකට පසුව, සියලුම දරුවන් නැවත වරක් හමුවක් සැමරීමට ඔවුන්ගේ භෞතික මිහිරි නිවහන වන මධුබාන් වලට ළඟා වී සිටියි. මධුබාන් යනු භෞතික ලෝකයේ ඇති මිහිරි නිවහනයි, මෙහි පරම පියා සහ දරුවන් අතර ආධ්‍යාත්මික මේලාවන් පැවැත්වෙයි මෙය හමුවක් සඳහා මේලාවකි (සමූහයක්). ඉතිං ඔය සියලු දරුවන් හමුවක් වෙනුවෙන් මෙම සමූහය තුළට ඇවිත්. පරම පියා සහ දරුවන් සඳහා හමුවක් වෙනුවෙන් ඇති මෙම සාමූහික එකතුවීම් සිදුවන්නේ සංගම යුගයේදි පමණයි, එමෙන්ම ඒවා පැවැත්වෙන්නේ මධුබාන් වලදි පමණයි. ඔය සියලු දෙනාම මෙහි දුවගෙන විත් මධුබාන් වලට ළඟා වී ඇත්තේ මේ නිසයි. ඔබට බාප්දාදාව ශාරීරික ස්වරූපයෙන් හමුවීමට මධුබාන් මඟපාදයි. එය සමගම ඔබ පහසු ස්මරණයේ සිටීමෙන් එය ඔබට අව්‍යක්ත හමුවක් ඇති කිරීමටත් මඟපාදයි, මන්ද, ඔබට ආධ්‍යාත්මික හමුවක සහ ශාරීරික ස්වරූපයේ හමුවීමක අත්දැකීම ලබා දීමේ ආශිර්වාදය මධුබාන් භූමියට ලැබී තිබේ. එය මෙම ආශිර්වාදය ලැබී ඇති භූමිය නිසා ඔබ පහසුවෙන් හමුවක අත්දැකීම ලබයි. වෙනත් කිසිම ස්ථානයක ඥාන සාගරය සහ ඥාන ගංගා අතර හමුවක් සිදුවන්නේ නැත. සාගරය සහ ගංගාවන් හමුවීමට ඇති එකම ස්ථානය මෙයයි. ආශිර්වාද ලැබී ඇති එවන් ශ්‍රේෂ්ඨ භූමියකට ඔබ පැමිණ ඇති බව ඔබ විශ්වාස කරනවාද?

මෙම කල්පයේ ප්‍රථම වතාවට හමුවක් සමරන දරුවන්ටයි මෙම විශේෂ ස්වර්ණමය අවස්ථාව තපස්යා වර්ෂයේදි ලබා දී තිබෙන්නේ. ඔබ කෙතරම් භාග්‍යවන්තද! තපස්යා වර්ෂය ආරම්භයේදි අලුත් දරුවන්ට අතිරික්ත බලය ලැබී තිබේ. ආරම්භයේ ලබා දී ඇති මෙම අතිරික්ත බලය ඔබට ඉදිරියට ගමන් කිරීමට මඟ පෑදිම සඳහා අනාගතයේ සහයෝගී වෙයි. ඔවුන්ට ඉදිරියට ගමන් කිරීමට මඟපෑදීම සඳහා නාටකයත් අලුත් දරුවන්ට සහයෝගය ලබා දී ඇත. එබැවින් ඔවුන්ට මෙසේ පවසමින් පැමිණිලි කිරීමට නොහැකි වෙයි, 'අපි ආවේ පසුවයි.' නැහැ. තපස්යා වර්ෂයට ආශිර්වාදයක්ද ලබා දී තිබේ. ඔබට තපස්යා වර්ෂයේදි ආශිර්වාද ලත් භූමියේ පය තැබීමට අයිතිය සහ අවස්ථාව ලැබී ඇත. මෙම අතිරික්ත භාග්‍යය සුළුපටු නැහැ. ඔය අලුත් දරුවන්ට ආශිර්වාද තුනක් විශේෂයෙන් ලැබී ඇත තපස්යා වර්ෂය, මධුබාන් භූමිය සහ ඔබගේ උත්සාහයන්. එබැවින් ඔබ කෙතරම් වාසනාවන්තද! මෙම අවිනාශී භාග්‍යයේ කුල්මත් බව ඔබ සමග තබාගන්න. මෙම කුල්මත් බව තිබිය යුත්තේ ඔබ මෙහි සිටින විට පමණක් නොවෙයි, පරම පියා අවිනාශීය, ඔය ශ්‍රේෂ්ඨ ජීවාත්ම අවිනාශීය, එබැවින් ඔබගේ භාග්‍යයත් අවිනාශීය. අවිනාශී භාග්‍යය ඔබ සමග සදාකාලිකව තබාගන්න. එය, පහසු අන්දමකින් එයට අවධානය යොමු කිරීමේ කාරණයක් පමණයි ආතතිය සමග අවධානය නොවෙයි. පහසු අවධානය තිබිය යුතුයි. එමෙන්ම අපහසු වන්නේ කුමක්ද? ඔබ 'මගේ බාබා' හඳුනාගෙන ඇති අතර ඔබ ඔහුව පිළිගෙනද තිබේ. ඔබ ඔහුව හඳුනනවා, ඔබ ඔහුව පිළිගෙන තිබේ, ඔබ ඔහුව අත්විඳ තිබේ එමෙන්ම ඔබ අයිතියක් හිමි කරගෙන තිබේ, එබැවින් අපහසු වන්නේ කුමක්ද? 'මගේ බාබා වන්නේ ඒකායන කෙනා පමණයි' නොකඩවා මෙය සරළව අත්විඳින්න. සම්පූර්ණ ඥානය මෙයයි.

මුල සිට මැද හරහා අවසානය දක්වාම මෙම සම්පූර්ණ ඥානය 'බාබා' යන වචනය තුළ මුසු වී තිබේ, මන්ද, බීජය වන්නේ බාබාය. මුළු වෘක්ෂයම බීජය තුළ මුසු වී තිබේ, එහෙම නේද? විස්තාරණය අමතක වීම, සිදුවිය හැක්කක්, නමුත් 'බාබා' යන වචනයේ ඇති සාරය සිහි කිරීම අපහසු නැත. එය සෑම විටම පහසුයි නේද? එය විටෙක අපහසු වන අතර විටෙක පහසු වන්නේ නැහැ. බාබා සෑම විටම ඔබගේද නැත්නම් ඔහු ඔබගේ වන්නේ ඇතැම් විට පමණයිද? බාබා සෑම විටම ඔබගේ නිසා ස්මරණයද සෑම විටම පහසු විය යුතුයි එය අපහසු දෙයක් නොවෙයි. 'ඔබ මගෙයි' කියා පරමාත්ම දෙවියන් පැවසූ අතර 'ඔබ මගෙයි' කියා ඔබ පැවසුවා. එසේ නම් අපහසු වන්නේ කුමක්ද? අලුත් ළමයි වඩාත් ඉදිරියෙන් ගමන් කරන්නේ මේ නිසයි. දැන් වුවත් ඔබට ඉදිරියට ගමන් කිරීමට තවමත් අවස්ථාව තිබේ. අවසන් සමාප්තිය සඳහා හොරණෑව තවමත් නාද වී නැත. එබැවින් පියාසර කර නොකඩවා අන් අයවත් පියාසර කරවන්න. මෙය කළ යුතු අන්දම වන්නේ නිෂ්ඵලත්වය අවසන් කිරීමය. ඔබගේ ඉතිරුම් ගිණුමේ අඛණ්ඩව එක්රැස් කරගන්න, මන්ද, උපත් 63කට ඔබ ඉතිරි නොකර අපතේ යවමින් සිට ඇත. ඒවා අපතේ හැරීමෙන් ඔබගේ සියලුම ගිණුම් අඩුවී ඇත. ඔබ හුස්මේ සම්පත, සිතිවිල්ලේ සම්පත, කාලයේ සම්පත, ගුණදම් වල සම්පත, බලයන්ගේ සම්පත, මෙන්ම ඔබ ඥාන

සම්පතද අපතේ හැරියා. බොහෝ ගිණුම් හිස්වී ඇත! ඔබ දැන් මේ සියලු ගිණුම්වල රැස්කර ගත යුතුයි. ඒවා රැස්කර ගැනීමේ කාලය දැන්ය එමෙන්ම ඒවා රැස්කර ගැනීමේ පහසු ක්‍රමය පරම පියා විසින් ඔබට පෙන්වා දෙනවා. ඒවා වියදම් කරන විට, විනාශ වන සම්පත් අඩු වන නමුත් ඔබ මේ සියලුම සම්පත් පිවිතුරු ආකල්පයකින් තමන් වෙනුවෙන් සහ අන් අය වෙනුවෙන් වැඩියෙන් භාවිත කරන තරමට, ඒවා වැඩි වී එක්රැස් වෙයි. මෙහිදි, සම්පත් රැස්කර ගැනීමේ ක්‍රමය වන්නේ ඒවා භාවිත කිරීමය. එහිදි ඒවා රැස්කර ගන්නා අන්දම වන්නේ ඒවා තබා ගැනීමයි මෙහිදි ඒවා රැස්කර ගන්නා අන්දම වන්නේ ඒවා භාවිත කිරීමයි, එබැවින් වෙනසක් තිබෙනවා. තමන් වෙනුවෙන් හෝ අන් අය වෙනුවෙන් ඔබගේ කාලය සුබ කාර්යයක් වෙනුවෙන් භාවිත කරන්න. එවිට එය නොකඩවා වැඩි වෙයි. ඥානය භාවිතා කරන්න. ඒ අන්දමින්ම ඔබ ගුණදම් සහ බල වැඩියෙන් භාවිතා කරන තරමට, ඒවා වඩාත් වැඩි වෙයි. වෙන මිනිසුන් මෙන් නොසිතන්න ඔවුන් සෑම දෙයක්ම යතුරුලා තබාගෙන ඔවුන් බොහෝ රැස් කරගෙන ඇති බව සිතයි. ඒ ආකාරයෙන්ම ඔබගේ බුද්ධියේ බොහෝ ඥානය ඇති බව, ඔබට බොහෝ ගුණදම් සහ බලද ඇති බව ඔබද සිතයි. මේවා යතුරු දමා නොතබන්න! ඒවා භාවිතා කරන්න! රැස්කර ගැනීම සඳහා භාවිත කළ යුතු ක්‍රමවේදය ඔබට වැටහෙනවාද? ඒවා ප්‍රයෝජනයට ගැනීමයි. ඒවා තමන් වෙනුවෙන් භාවිත කරන්න, නැත්නම් ඔබට ඒවා අහිමි වෙයි. සමහර දරුවන් පවසන්නේ සියලු සම්පත් ඔවුන් තුළ මුසු වී තිබෙන බවයි. කෙසේවෙතත්, මේවා ඔබ තුළ මුසු වී ඇති බවට සලකුණ කුමක්ද? ඒවා තමන් තුළ මුසු වී තිබීම යනු ඔබ ඒවා එක්රැස් කර ගෙන ඇති බවයි. මෙහි සලකුණ වන්නේ අවශ්‍ය වෙලාවට තමන් වෙනුවෙන් සහ අන් අය වෙනුවෙන් ඒවා ප්‍රයෝජනවත් වන බවයි. ඒවා භාවිත නොවන්නේ නම් ඒ තිබියදි ඔබ බොහෝ රැස් කරගෙන ඇති බව කියන්නේ නම්, එය ඒවා එක්රැස් කරගැනීමේ නිවැරදි ක්‍රමයක් නොවෙයි. එබැවින්, ඔබ භාවිත කරන ක්‍රමවේදය නිවැරදි නැත්නම්, නිසි වෙලාවට අංගසම්පූර්ණ වීමේ ප්‍රතිඵලය ඔබට අත්කර ගැනීමට නොහැකි වෙයි. ඔබ මුලා වෙයි. ඔබ සාර්ථක නොවෙයි.

බල සහ ගුණදම් භාවිතා කරන්න, එවිට ඒවා අඛණ්ඩව වැඩි වෙයි. එබැවින් ඉතිරි කරගැනීමේ ක්‍රමවේදය සහ එක්රැස් කරගැනීමේ ක්‍රමවේදය භාවිත කරන්න. එවිට අපතේ යෑමේ ගිණුම ඉබේටම පරිවර්ථනය වී වටිනා අන්දමකින් භාවිත වෙයි. ඔවුන්ට තිබෙන ප්‍රමාණයට අනුව, භක්ති මාර්ගයේ, භෞතික ධනය දන් දී, එය වටිනා අන්දමකින් භාවිත කරන ක්‍රමවේදයක් තිබේ. එබැවින් එය දිගටම වැඩිවෙයි. භක්ති මාර්ගයේ පවා සෑම දෙයක්ම වටිනා ලෙස භාවිතා කිරීම සඳහා, ඔවුන්ගේ උනන්දුව සහ උද්යෝගය වැඩි කරයි. එබැවින් තපස්යා වර්ෂයේදි ඔබ කෙතරම් අපතේ යවා ඇද්ද කියා පමණක් පරීක්ෂා නොකරන්න - යමක් අපතේ හැරීම වෙනම කාරණයක් - නමුත් ඔබ කෙතරම් වටිනා ලෙස භාවිත කර තිබේද කියාත් පරීක්ෂා කරන්න. ඔබට පවසන ලද සියලුම සම්පත් එමෙන්ම ගුණධර්මත් පරම පියාගෙන් ලද තිළිණයි. 'මෙය මගේ ගුණදහමයි, මෙය මගේ බලයයි', මෙම වරද සිහිනෙන් වත් නොකරන්න. මේවා පරම පියාගෙන් ලද තිළිණයි, පරමාත්ම දෙවියන්ගෙන් ලද තෑගිය. පරමාත්ම දෙවියන්ගෙන් ලද තෑගි තමන්ගේ කියා සැලකීම විශාල පාපයකි. බොහෝ දරුවන් මෙවන් සාමාන්‍ය භාෂාවකින් සිතමින් කතා කරයි, 'මගේ මෙම ගුණධර්මය භාවිත කෙරෙන්නේ නැහැ' හෝ 'මට මෙම බලය තිබෙනවා මගේ බුද්ධිය ඉතා හොඳයි, නමුත් එය භාවිතයට ගන්නේ නැහැ.' 'මගේ' පැමිණියේ කොහින්ද? 'මගේ' පැවසීම, එය කිලිටි කිරීමක්. භක්ති මාර්ගයේ වුවද ඔවුන් උපත් 63ක් අඛණ්ඩව මෙම ඉගැන්වීම ලබා දී ඇත 'මගේ' නොකියන්න, 'ඔබගේ' කියන්න. කෙසේවෙතත්, ඔබ ඒ ආකාරයෙන් එය පිළිගත්තේ නැහැ. ඥාන මාර්ගයේදි පවා 'ඔබගේ' කියා පවසන නමුත් 'මගේ' කියා සැලකීම රැවටීමක් වන අතර එය මෙහිදි ක්‍රියාත්මක නොවෙයි. එබැවින් පරමාත්ම දෙවියන්ගෙන් ලැබූ පූජනීය 'ප්‍රසාද්' තමන්ගේ බව සැලකීම යනු අහංකාරකමක් සහ අගෞරව කිරීමක්. 'බාබා, බාබා' යන වචනය කිසිදා අමතක නොකරන්න. බාබා, බලය දී තිබේ, බාබා, බුද්ධිය ලබා දී ඇත. එය බාබාගේ කාර්යයයි, එය බාබාගේ මධ්‍යස්ථානයයි සියල්ල අයත් බාබාටයි. මෙසේ නොසිතන්න මෙය මගේ මධ්‍යස්ථානයයි. මධ්‍යස්ථානය නිර්මාණය කළේ මා නිසා මට එයට අයිතියක් තිබේ. 'මගේ' යන වචනය පැමිණියේ කොහෙන්ද? එය ඔබගේද? ඔබ පොදියක් ප්‍රවේසමින් පැත්තකින් තබා තිබෙනවාද? බොහෝ දරුවන් එවන් කුල්මත් බවක් පෙන්වයි මධ්‍යස්ථානය වෙනුවෙන් ගොඩනැගිල්ල මා සෑදූ නිසා මට එයට අයිතියක් තිබේ. කෙසේවෙතත්, ඔබ ගොඩනැගුවේ කාගේ මධ්‍යස්ථානයද? එය බාබාගේ මධ්‍යස්ථානය නොවෙයිද? ඔබ එය බාබාට කැප කර ඇත්නම් එය ඔබගේ වන්නේ කෙසේද? 'මගේ' තිබෙන්නේ කෙසේද? ඔබගේ බුද්ධිය වෙනස් වන විට ඔබ පවසන්නේ, 'මෙය මගේ.' 'මගේ, මගේ' කීමෙන් ඔබ එය කිලිටි කළා. ඔබට නැවත වරක් කිලිටි වීමට අවශ්‍යද? ඔබ බ්‍රහ්මින් කෙනෙක් වූ විට, ඔබගේ බ්‍රහ්මින් දිවිය වෙනුවෙන් ඔබ

පියාට වුණු ප්‍රථම පොරොන්දුව ඔබට මතකද? අලුත් අයත් පොරොන්දුවක් වුනාද, නැත්නම් පරණ අය විතරද? දැන් පැමිණ ඇති ඔය අලුත් අය ඇවිත් සිටින්නේ පරණ අය ලෙසයි, එහෙම නේද? බුද්ධියේ විශ්වාසය තිබීම ගැන පෝරමය සම්පූර්ණ කිරීමෙන් අනතුරුවයි ඔබ ඇවිත් ඉන්නේ, එහෙම නේද? ඉතිං සියලු දෙනාගේ ප්‍රථම පොරොන්දුව වුණේ මනස, බුද්ධිය සහ ධනය යන සියල්ලම ඔබගේය. ඔබ සියලු දෙනාම මෙම පොරොන්දුව වුනාද?

ඔබ දැන් පොරොන්දුවක් වීමට යන්නේ නම් ඔබගේ අත් ඔසවන්න! මෙසේ සිතන අය, 'අනාගතය වෙනුවෙන් යමක් පසෙක තැබිය යුතුයි, අපි සෑම දෙයක්ම පියාට දෙන්නේ කොහොමද? අපි යමක් පසෙක දමා තැබිය යුතුයි.' මෙසේ කිරීම නුවණැති දෙයක් කියා සිතන අය තම අත් ඔසවන්න! ඔබ යමක් පසෙක තබා තිබෙනවාද? ප්‍රවේසම් වන්න! පසුව මෙසේ නොකියන්න, 'අපව දුටුවේ කවුරුන්ද?' 'මෙතරම් සෙනගක් මැද මාව දකින්නේ කවුද?' බාබාට ඉතා පැහැදිලි රූපවාහිනියක් තිබේ. ඔබට ඉන් සැඟව සිටිය නොහැක. එබැවින් හොඳින් සලකා බැලීමෙන් පසුව ඔබට යමක් පසෙක තැබීමට අවශ්‍ය නම්, එසේ කරන්න. පාණ්ඩවයන් සිතන්නේ කුමක්ද? ඔබ සුළු දෙයක් පසෙක තැබිය යුතුද? ඒ ගැන ඉතා හොඳින් සිතා බලන්න. සුළු යමක් පසෙක තැබීමට අවශ්‍ය බව සිතන අය, දැන් ඔබගේ අත් ඔසවන්න! ඔබව බේරා ගනු ලැබෙයි. එසේ නැත්නම් පසුව ඔබට මෙම කාලය, මෙම සමූහය සහ ඔබ හිස වැනීම ඔබට පෙන්වනු ලබනවා. කිසිම විටෙක 'මගේ' යන අවධානය නොතිබිය යුතුයි. ඔබ බාප් (පියා) පවසන විට, පාපය (පාප්) අවසන් වෙයි. ඔබ බාප් නොකියන විට පාපයන් සිදු වනවා. ඔබ පාපයේ බලපෑමට හසු වූ විට ඔබගේ බුද්ධිය ක්‍රියා නොකරයි. කෙනෙක් ඔබට කෙතරම් පහදා දීමට උත්සාහ කළත් ඔබ කියන්නේ, 'නැහැ, මෙය හරි, මෙය සිදුවිය යුතුයි, මෙය කළ යුතුයි.' ඒ වෙලාවේ ඔබ පාපයේ බලපෑම යටතේ සිටින නිසා පියාටත් අනුකම්පාවක් ඇති වෙයි. පියාව අමතක වූ විට, පාපයන් සිදු වෙයි. ඔබ පාපයේ බලපෑම යටතේ සිටින නිසා ඔබ කරන්නේ සහ කියන්නේ කුමක්ද කියා ඔබට නොවැටහෙයි. නිරන්තරයෙන් ඥානය යොදා අවධානයෙන් සිටින්න. කිසිම පාපයක බලය යටතට නොපැමිණෙන්න. අතර මැදට මායාගේ මෙම රැල්ල පැමිණෙයි. ඔය අලුත් අය තමන්ව මෙයින් ආරක්ෂිතව තබා ගත යුතුයි. 'මගේ, මගේ' යන කිසිඳු අවධානයක් තුළ සිර නොවන්න. ජීවාත්ම ටිකක් මුහුකුරා ගිය පසු ඔවුන්ට 'මගේ, මගේ' යන අවධානය ඇතිව බොහෝ මායා තිබෙයි. 'මගේ අදහස්'. කෙසේවෙතත්, බුද්ධියත් ඔබගේ නොවන විට, ඔබගේ අදහස ආවේ කොහෙන්ද? එබැවින් එක්රස් කරගන්නා ක්‍රමවේදය කුමක්ද කියා ඔබට වැටහෙනවාද? එය කාර්යයක් වෙනුවෙන් භාවිත කරන්න. එය වටිනා ආකාරයකට භාවිතා කරන්න. ඔබගේ දේවමය සංස්කාර වටිනා ලෙස භාවිතා කරන්න එවිට නිෂ්ඵලත්වයේ සංස්කාර පිටවී යයි. ඔබගේ දේවමය සංස්කාර ඔබ කාර්යයක් වෙනුවෙන් භාවිත නොකරන විට, ඒවා නිකම්ම ඔබ අගුල් දමා තබයි, එමෙන්ම පැරණි සංස්කාර නොකඩවා ක්‍රියාත්මක වෙයි. සෑම දෙයක්ම බැංකුවක හෝ ඔවුන්ගේ අල්මාරි තුළ තබාගැනීමේ පුරුද්ද බොහෝ දෙනෙකුට තිබේ. ඔවුන්ට බොහෝ අලංකාර ඇඳුම්, මුදල් සහ භාණ්ඩ තිබෙන නමුත් ඔවුන් භාවිත කරන්නේ පරණ දේවල් පමණයි. ඔවුන්ගේ පරණ දේවලට ඔවුන් බොහෝ ප්‍රිය කරන නිසා අල්මාරියේ තිබෙන දේවල් අල්මාරිය තුළම තිබෙන අතර ඔවුන් පරණ දේවල් පමණක් භාවිත කරමින් එලියට යයි. ඔබගේ පැරණි සංස්කාර දිගටම භාවිත කරමින් දේවමය සංස්කාර ඔබගේ බුද්ධිය නම් අගුල් දැමූ අල්මාරිය තුළ නිකම්ම නොතබන්න. ඒවා කාර්යයක් වෙනුවෙන් භාවිත කරන්න ඒවා වටිනා ලෙස භාවිත කරන්න. ඉතිං ඔබ සෑම දෙයක්ම කෙතරම් ප්‍රමාණයක් වටිනා ලෙස භාවිතා කළාද කියා සටහනක් තබන්න. යම් දෙයක් වටිනා ලෙස භාවිත කිරීම යනු එය භාවිතා කර වැඩි කර ගැනීමයි. ඔබගේ මනසින්, වදන් වලින්, නෑ සබඳතා වලදී, ක්‍රියා තුළින්, ශ්‍රේෂ්ඨ ඇසුරින් සහ ඔබගේ උපරිම ලෙස ශක්තිමත් ආකල්පයෙන් සෑම දෙයක්ම වටිනා ලෙස භාවිතා කරන්න. 'මගේ ආකල්පය සෑම විටම ඉතා හොඳයි' කියා නොසිතන්න. එසේ නම් එයින් කෙතරම් ප්‍රමාණයක් වටිනා ලෙස භාවිත කළාද? 'මගේ සංස්කාර කොහොමත් සාමකාමීය'. එසේ නම් ඉන් කෙතරම් ප්‍රමාණයක් වටිනා ලෙස භාවිත කිරීමට යෙදවූවාද? ඔබ ඒවා භාවිතා කළාද? ඒවා කාර්යයකට භාවිත කිරීමේ ක්‍රමවේදය යොදා ගැනීමෙන් ඔබ පහසුවෙන් අංගසම්පූර්ණ වීමේ සාර්ථකත්වය අත්දකිවි. යම් දෙයක් වටිනා අන්දමකින් භාවිතා කිරීම සාර්ථකත්වයට යතුරයි. ඔබ කළ යුත්තේ කුමක්ද කියා ඔබට වැටහෙනවාද? නිකම්ම තමන් සමග සතුටට පත් නොවන්න 'මම ඉතා හොඳයි එමෙන්ම ගුණවත්ය, මට ඉතා හොඳින් දේශන පැවැත්විය හැක, මා ඉතා හොඳ ඥානී ජීවාත්මයක් එමෙන්ම මගේ යෝගාව ඉතා හොඳයි.' ඉතිං, එය එතරම් හොඳ නම් එය භාවිතා කරන්න! එය වටිනා අන්දමකින් භාවිතා කරන්න. එය කාර්යයක් වෙනුවෙන් භාවිත කර වැඩි කරගන්න. කිසිම උත්සාහයක් නොමැතිව එය අඛණ්ඩව වැඩි වී ඉන්පසුව ඔබ උපත් 21ක් එය සැපයෙන් භාවිතා කරයි. ඔබට එහිදී කිසිම උත්සාහයක් දැරීමට සිදු නොවෙයි.

මෙය අසීමිත සමූහයක්. (ඕම් ශාන්ති භවන් සම්පූර්ණයෙන් පිරී ඉතිරී තිබුණු අතර එබැවින් ඇතැම් පුද්ගලයන්ට භාවනා ශාලාවේ සහ හිස්ට්රි ශාලාවේ අසුන් ගැනීමට සිදු විය. ශාලාවේ ඉඩ මදි විය.) ශාස්ත්‍රවල ඔබගේ සිහිවටනයේ වර්ණනාව සඳහන් කර තිබේ පළමුව ජලය වීදුරුවකට දමන ලදි, ඉන්පසුව එය මුට්ටියකට දමන ලදි, ඉන්පසුව පොකුණකට, පසුව පොකුණෙන් එය ගඟට ගලා ගියා. එය අවසානයේ ගියේ කොහිද? මුහුදට. ඉතිං, මෙම හමුව ප්‍රථමයෙන් පැවැත්වුනේ හිස්ට්රි ශාලාවේ, ඉන්පසුව භාවනා ශාලාවේ, එමෙන්ම එය දැන් ඕම් ශාන්ති භවන්හි පැවැත්වෙමින් තිබෙනවා. දැන් එය පවත්වන්න යන්නේ කොහිද? කෙසේවෙතත්, මින් අදහස් වන්නේ ශාරීරික හමුවක් නොමැතිව, ඔබට අව්‍යක්ත හමුවක් අත්විඳීමට නොහැකි බව නොවෙයි. කාලයට අනුව අව්‍යක්ත හමුවේ පුහුණුව වැඩි විය යුතු අතර ඔබ එය වැඩි කළ යුතුයි. දාදීන් දයාවන්ත වී, අලුත් අය වෙනුවෙන් ඔවුන් තුළ විශේෂ දයාවක් තිබුණි. කෙසේවෙතත්, අව්‍යක්ත අත්දැකීම වැඩි කරගන්න. එය ඔබට නිසි වෙලාවට ප්‍රයෝජනවත් වෙයි. බලන්න, බාප්දාදා දැන් තවමත් අලුත් දරුවන් වෙනුවෙන් ශාරීරික කොටස රඟපානවා, නමුත් මෙය කෙතරම් කාලයක් පවතිද? ඉතිං, ඔබ සියලු දෙනාම සතුටින් සහ තෘප්තියෙන්ද? ඔබ පිටත සිටීම ගැනත් තෘප්තිමත්ද? මෙයත් නාටකයේ ඇති කොටසක්. මුළු අබූම ඔබට අයත් වීමට යන බව ඔබ පවසන බැවින්, මෙය සිදුවීමට යන්නේ කෙසේද? ඉතිං ප්‍රථමයෙන් අඩු තරමින් ඔබගේ දෙපය එහි තබන්න! ඉන්පසුව ධර්මශාලා ලෙස හැඳින්වෙන සියලුම ස්ථාන ඔබගේ වෙයි.

බලන්න, විදෙස් රටවලත් එය දැනටමත් සිදුවීම ඇරඹී ඇත. ක්‍රිස්තියානි පූජස්ථාන එතරම් භාවිතා නොවන නිසා ඒවා භාවිත කිරීමට ඔවුන් බ්‍රහ්ම කුමාරීන්ට ඇරයුම් කර ඇත. එබැවින් මිනිසුන්ට තිබෙන නමුත් පවත්වා ගෙන යා නොහැකි එම විශාල ස්ථාන, භාවිත කිරීමට ඔබට ඇරයුම් කරයි. එබැවින් බ්‍රහ්මිණ්වරුන්ගේ දෙපය සෑම ස්ථානයකම තැබෙනවා. මෙහිද වැදගත්කමක් තිබේ. එබැවින් ඔවුන්ගේ දෙපය එහි තැන්පත් කිරීමේ චරිත කොටසක් බ්‍රහ්මිණ්වරු නාටකයේ රඟපායි. ඉතිං මුළු අබූම ඔබගේ වූ විට ඔබ කරන්නේ කුමක්ද? ඔවුන්ම මෙසේ කියමින් ඔබට එය පුද කරයි, 'ඔබ එය බලාගන්න.' ඔවුන් මෙසේ කියයි, 'අපව රැක බලා ගන්න එමෙන්ම ආශ්‍රමයද රැක බලාගන්න.' එබැවින් ඔබට ඕනෑම වෙලාවක කුමන චරිත කොටසක් ලැබුණත් එම කොටස සතුටින් රඟපාන්න. අච්ඡා.

හමුවක් සමරණ සහ ඥාන මැණික් ධාරණය කරගන්නා සෑම තැනකම සිටින චාත්‍රක් ජීවාත්මයන්ට, සූක්ෂම ස්වරූපයෙන් සහ ශාරීරික ස්වරූපයෙන් හමුවක් සමරන ශ්‍රේෂ්ඨ ජීවාත්මයන්ට, සියලුම සම්පත් වටිනා ලෙස භාවිත කර සාර්ථකත්වයේ ප්‍රතිමූර්ති වන ජීවාත්මයන්ට, අසීමිත නිරාශාව ඇති සහ නිරන්තරයෙන් 'මගේ බාබා' යන අවධානය ඇති සහ කිසිඳු සීමිත 'මගේ' යන අවධානයක් නොමැති ජීවාත්මයන්ට, නිවැරදි ක්‍රමවේදය භාවිතා කිරීමෙන් අංගසම්පූර්ණත්වයට පත් වීමේ නිරන්තර සාර්ථකත්වය අත්කර ගන්නා දරුවන්ට, බාප්දාදාගේ සෙනෙහස, ස්මරණය සහ නමස්කාරය.

බාප්දාදා දාදීන්ට කතා කරමින් සෑම විටම අලුත් ජවනිකා තිබිය යුතුයි, එහෙම නේද? මෙයත් නාටකයේ අලුත් ජවනිකාවක් වන අතර එය නැවත වතාවක් සිදුවිය. මෙම ශාලාවත් මදි වෙයි කියා ඔබ කිසි විටෙක සිතුවාද? එකම ජවනිකාව සෑම විටම තිබෙනවාට ඔබ කැමති නොවෙයි. විටෙක අලුත් ජවනිකාවක් දැකීමට ඔබ ප්‍රිය කරයි. මෙයත් ආධ්‍යාත්මික ශෝභාව, එහෙම නේද? මේ සියලුම ජීවාත්මයන්ගේ සිතිවිලිල ඉටුකළ යුතු විය, මෙම ජවනිකාව සිදු වුණේ ඒ නිසයි. ඔබ මෙහි සිට අවසර ලබා දුන්නා, 'ඔබට පැමිණිය හැක!' එබැවින් කෙනෙක් කුමක් කරන්නද? දැන් අලුත් අය වැඩි වී වැඩිමහල් අය දැන් මහළුයි. ඔබ උද්යෝගයෙන් පැමිණි අතර ඒ අනුව තමන්ව තැන්පත් කළා, එමෙන්ම එය හොඳයි. එය විශාල විය යුතුයි. එය මීට වඩා කුඩා වෙන්නේ නැහැ. ලොවට සෙත සලසන්නෙක් වීම යන නම්බු නාමය ඇති නිසා ලොව හා සසඳන විට මෙය සුළුතරයක්. විස්තාරණය සිදුවීමට යන අතර ක්‍රමවේදයද අලුත් වෙයි. විවිධ ක්‍රමවේද තිබෙයි. දැන් ආකල්පය බලවත් වෙයි. තපස්යාවේ සිටීමෙන් ඔබගේ ආකල්පය බලවත් වෙයි, එවිට ඔබගේ ආකල්පය තුළින් ජීවාත්මයන්ගේ ආකල්ප ඉබේටම වෙනස් වෙයි. අච්ඡා. සේවය කිරීමෙන් ඔබ සියලු දෙනා වෙහෙසට පත් වන්නේ නැහැ නේද? ඔබ සතුටින් මෙහි පැමිණෙයි. සෑම විටම සතුට තිබේ. අච්ඡා.

**වරදානය:** ශ්‍රේෂ්ඨ කර්ම සිදු කිරීමෙන් ඔබගේ ආශිර්වාද තොගය රැස් කර, ඔබ දර්ශන ලබා දෙන ජීවමාන ප්‍රතිමාවක් වේවා.

ඔබ සිදු කරන කුමන ක්‍රියාවකින් වුවද ආශිර්වාද ලබා ගෙන ආශිර්වාද ලබා දෙන්න. ශ්‍රේෂ්ඨ කර්ම සිදු කිරීමෙන් ඔබට ඉබේටම සියලු දෙනාගේ ආශිර්වාද ලැබෙයි. සියලු දෙනාගේ

මුවගින් මෙය මතුවෙයි මේ කෙනා ඉතා හොඳයි. අපූරුයි! ඔබගේ ක්‍රියා සිහිවටනයක් වෙයි. ඔබ කුමන වැඩක් කළත් සතුට ලබාගෙන සතුට ලබා දෙන්න, ආශිර්වාද ලබා ගෙන ආශිර්වාද ලබා දෙන්න. ඔබ සංගම යුගයේ ආශිර්වාද ලබා ගෙන ආශිර්වාද ලබා දෙන නිසා, ඔබගේ අජීවි ප්‍රතිමා තුළින් මිනිසුන් නොකඩවා ආශිර්වාද ලබා ගන්නා අතර වත්මන් කාලයේද ඔබ දර්ශන ලබා දෙන ජීවමාන පිළිරූ වෙයි.

**පාඨය:** නිරන්තරයෙන් උනන්දුව සහ උද්යෝගය පවත්වාගන්න, එවිට අලසකම අවසන් වෙයි.

***** ඕම ශාන්ති *****